**ශ්‍රී ලංකා රාජ්‍ය ඉංජිනේරු සංස්ථාව - 2022**

**-----------------------------------------------------**

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 වියාචනය කළ මතය

ශ්‍රී ලංකා රාජ්‍ය ඉංජිනේරු සංස්ථාවේ ("සංස්ථාව" ) 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය , හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අදාළ තොරතුරු ද ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්වලින් සමන්විත 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2021 අප්‍රේල් 27 දිනැති අංක අමප/21/0631/306/037 දරන අමාත්‍ය මණ්ඩල තීරණයට අනුව, ජාතික යන්ත්‍රෝපකරණ ආයතනය (NEMO) සංස්ථාවෙහි ඒකකයක් ලෙස ඒකාබද්ධ කර තිබුණි. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

2022 වර්ෂයේදී මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීමට ප්‍රමාදය හේතුවෙන්, 2025 අප්‍රේල් 28 වන දින 2වෙනි කාණ්ඩයේ - XLII කොටස යටතේ 2022 වර්ෂයේ මෙහෙයුම් ක්‍රියාකාරකම් පිළිබඳ වාර්තාවක් පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලද අතර, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවට අනුකූලව මෙම වාර්තාව නිකුත් කෙරේ.

සංස්ථාවේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මම මතයක් ප්‍රකාශ නොකරමි. මාගේ වාර්තාවේ මතය වියාචනය සඳහා පදනම කොටසේ සාකච්ඡා කර ඇති කරුණුවල වැදගත්කම හේතුවෙන්, මෙම මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් විගණන මතයක් සඳහා පදනමක් සැපයීමට ප්‍රමාණවත් හා උචිත විගණන සාක්ෂි ලබා ගැනීමට මා හට නොහැකි විය.

### 1.2 මතය වියාචනය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ විස්තර කර ඇති පරිදි, මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ, විස්තීර්ණ ආදායම් ප්‍රකාශනයේ, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනයේ සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනයේ ඇතුළත් ප්‍රමාණාත්මක අයිතම විකල්ප ක්‍රම මගින් තහවුරු කිරීමට හෝ සත්‍යාපනය කිරීමට මට නොහැකි විය. මෙම කරුණු හේතුවෙන්, වාර්තා කළ හෝ වාර්තා නොකළ මුදල් සහ මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය, විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය, සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සම්බන්ධයෙන් කිසියම් ගැළපීමක් අවශ්‍ය වී ඇත්දැයි මට තීරණය කිරීමට නොහැකි විය.

### 1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට, අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, සංස්ථාව අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය සංස්ථාව ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ

පදනම මත ගිණුම් තැබීම හා සංස්ථාවේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

සංස්ථාවේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, සංස්ථාවේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව පවත්වනු ලබන විගණනය මත පදනම්ව සංස්ථාවේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ වගකීම වේ. කෙසේ වුවද, මතය වියාචනය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණු හේතුවෙන් මෙම මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් විගණන මතයක් සඳහා පදනමක් සැපයීමට ප්‍රමාණවත් හා උචිත විගණන සාක්ෂි ලබා ගැනීමට මා හට නොහැකි විය.

## 1.5 මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කිරීම සම්බන්ධයෙන් විගණන නිරීක්ෂණ

### 1.5.1 ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූල නොවීම

| | අදාළ ප්‍රමිතියට යොමුව සහිතව අනුකූල නොවීම | කළමණාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති 01 හි 32 වන ඡේදයට පටහැනිව, රු.මිලියන 342.84 ක් වූ ලෙජර් ගිණුම් 08 ක හර ශේෂයන් ඒවායේ බැර ශේෂයන් සමඟ හිලව් කර තිබුණි. තවද, රු.මිලියන 531.55 ක සමස්ත අගයක් ගන්නා තවත් ලෙජර් ගිණුම් 08 ක බැර ශේෂයන් ඒවායේ හර ශේෂයන් සමඟ හිලව් කර තිබුණි. එබැවින්, මූල්‍ය ප්‍රකාශනයේ ජංගම වගකීම් සහ ජංගම වත්කම් පිළිවෙලින් එම මුදලින් අඩුවෙන් දක්වා තිබුණි. | සටහන් ඇතුළත් කිරීමේදී සිදු වූ අතපසුවීම් මෙන්ම නිවැරදි සැපයුම්කරු හෝ නිවැරදි මාර්ගය හඳුනා නොගැනීම හේතුවෙන්, වෙළඳ ගෙවිය යුතු ගිණුම්වල හර ශේෂයන් සහ වෙළඳ ලැබිය යුතු ගිණුම්වල බැර ශේෂයන් ලෙස මේවා දැක්වීමට හේතු වී තිබුණි. එබැවින්, මේ සඳහා නිවැරදි කිරීමේ පියවර දැනටමත් ගනු ලබමින් පවතී. | ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ප්‍රමිති (SLFRS) මඟින් අවශ්‍ය කර ඇති හෝ අවසර දී ඇති අවස්ථාවලදී හැර, සංස්ථාව විසින් වත්කම් සහ වගකීම් හෝ ආදායම් සහ වියදම් හිලව් නොකළ යුතුය. මෙය ඉදිරි මූල්‍ය ප්‍රකාශනවලදී නිවැරදි කළ යුතුය. |
| (ආ ) | ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිය 16 හි 51 වන ඡේදයට පටහැනිව, සංස්ථාව විසින් සමාලෝචනයට භාජනය වන වර්ෂය අවසන් වන විට රු.මිලියන 400.68 ක ධාරණ මුදලක් තිබූ ඇතැම් ස්ථාවර වත්කම්වල අවශේෂ වටිනාකම සහ ප්‍රයෝජනවත් ආයු කාලය සමාලෝචනය කර නොතිබුණි. තවද, රු.මිලියන 1,132.10 ක මුළු පිරිවැයක් සහිත වත්කම් | මෙම කාරණය සංස්ථා විගණන සහ කළමනාකරණ කමිටුවට ඉදිරිපත් කරන ලද අතර තාක්ෂණික වශයෙන් යෝග්‍ය තක්සේරුවක් හරහා සමාලෝචනය කිරීම සඳහා එහි උප කමිටුවක් පත් කර ඇත. තක්සේරු කමිටුවේ ප්‍රතිඵල සමඟ අවශ්‍යතාවය සපුරාලනු ඇත. | වත්කමක අවශේෂ වටිනාකම සහ ප්‍රයෝජනවත් ආයු කාලය අවම වශයෙන් සෑම මූල්‍ය වර්ෂයක් අවසානයේම සමාලෝචනය කළ යුතු අතර අදාළ ප්‍රමිතීන්ට අනුකූලව සම්පූර්ණයෙන්ම ක්ෂය වූ වත්කම්වල දළ ධාරණ අගය හෙළි කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | සම්පූර්ණයෙන්ම ක්ෂය කර ඇති නමුත් තවමත් භාවිතයේ පවතී. කෙසේ වෙතත්, ප්‍රමිතියේ 79(ආ) ඡේදය යටතේ අවශ්‍ය පරිදි ඇස්තමේන්තු දෝෂය නිවැරදි කිරීමට හෝ මෙම සම්පූර්ණයෙන්ම ක්ෂය වූ වත්කම්වල දළ ධාරණ මුදල හෙළි කිරීමට කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි. | 79(ආ ) ඡේදය යටතේ හෙළිදරව් කිරීමේ අවශ්‍යතාවයට අනුකූල වීම 2023 දී සම්පූර්ණ වේ. | |

### 1.5.2 ගිණුම්කරණ අඩුපාඩු

| | විගණන නිරීක්ෂණ | කළමණාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සංස්ථාවේ මූල්‍ය ප්‍රකාශන සහ ස්ථාවර වත්කම් ලේඛනය අතර ස්ථාවර වත්කම්වල වටිනාකමෙහි රු. මිලියන 2.08 ක හඳුනා නොගත් වෙනසක් පවතී. | 2025 වර්ෂයේදී නිවැරදි කිරීමේ ක්‍රියාමාර්ග ගැනීම සටහන් කර ගන්නා ලදී. | ස්ථාවර වත්කම් ලේඛනය සහ මූල්‍ය ප්‍රකාශනය සැසඳීමෙන් පසු ඒවා නිවැරදිව සකස් කිරීමට කටයුතු කළ යුතුය. |
| (ආ) | සංස්ථාවේ අංශ අතර පවත්වාගෙන යනු ලබන ජංගම ගිණුම්වල ශේෂයන් සමාලෝචිත වර්ෂය අවසන් වන විට එකිනෙක සමඟ සංසන්දනය කළ යුතු වුවද, මූල්‍ය ප්‍රකාශනවල “අභ්‍යන්තර අංශ අතර ජංගම ගිණුම්” ලෙස රු. මිලියන 133.09 ක හර ශේෂයක් අනෙකුත් ලැබිය යුතු දේ යටතේ පැවතුන අතර, සංස්ථාවේ සහ ජාතික යන්ත්‍රෝපකරණ ආයතනයේ (NEMO) මූල්‍ය ප්‍රකාශනවල ජංගම ගිණුම් ශේෂය අතර රු.මිලියන 194.44 ක වෙනසක් නිරීක්ෂණය විය. කෙසේ වෙතත්, වෙනසට හේතු විගණනයට අනාවරණය නොවීය. | අභ්‍යන්තර අංශ අතර ජංගම ගිණුම් සහ අන්තර් සමාගම් ජංගම ගිණුම් ශේෂයන් එකිනෙකට අනුරූප වියයුතු බව පිළිගනු ඇත. | අංශ අතර ජංගමෙ ගිණුම් ශේෂයන් මෙන්ම සංස්ථාව සහ ජාතික යන්ත්‍රෝපකරණ ආයතනය අතර ජංගම ගිණුම් ශේෂයන්හි වෙනස්කම් සැසඳීමට හා ගැලපීමට පියවර ගත යුතුය. |
| (ඇ) | 2022 දෙසැම්බර් 31 දිනට ජාතික යන්ත්‍රෝපකරණ ආයතනයේ මූල්‍ය ප්‍රකාශනය සහ ලාභ ගණනය කිරීමේ ප්‍රකාශනය අතර ගනුදෙනුකරුවන්ගෙන් ලැබිය යුතු ශේෂයන් සහ ගනුදෙනුකරුවන්ට ගෙවිය යුතු ශේෂයන්හි පිළිවෙලින් රු.මිලියන 1,019.89 ක සහ රු.මිලියන 582.63 ක වෙනසක් නිරීක්ෂණය විය. | ව්‍යාපෘති අවසන් වන තුරු, ශේෂ පත්‍රය හරහා ඉදිරිපත් කරන ලද ගනුදෙනුකරුවන්ගෙන් ලැබිය යුතු සහ ගනුදෙනුකරුවන්ට ගෙවිය යුතු ශේෂයන්, සම්පූර්ණ කිරීමේ ප්‍රතිශතය මත ආදායම හඳුනාගැනීමේ හා සහතික කළ බිල්පත්වල වෙනසේ ප්‍රතිඵලයකි. | අදාළ උපලේඛන සමඟ සැසඳීමෙන් පසු ගිණුම් නිවැරදිව සකස් කිරීමට පියවර ගත යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | 2022 දෙසැම්බර් 31 දිනට මහජන බැංකුව විසින් රු.මිලියන 0.87 ක් වටිනා ඉතුරුම් ගිණුම් ශේෂයන් තහවුරු කර තිබුණද, මෙම ශේෂයන් 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය ප්‍රකාශනයේ ඇතුළත් කර නොතිබුණි. | හෙළිදරව් කිරීමේ අවශ්‍යතාවය ඊළඟ වසර තුළ සපුරාලන අතර 2025 දී ගිණුම් පොත්වල සකස් කරනු ලැබේ. | මූල්‍ය ප්‍රකාශනවල සියලුම බැංකු ගිණුම් විස්තර හෙළිදරව් කිරීමට පියවර ගත යුතුය. |
| (ඉ) | EPF සහ ETF ගෙවිය යුතු උපලේඛන සහ ජාතික යන්ත්‍රෝපකරණ ආයතනයේ මූල්‍ය ප්‍රකාශනවල වාර්තා කර ඇති අනුරූප ශේෂයන් අතර පිළිවෙලින් රු.මිලියන 3.12 සහ රු.මිලියන 3.27 ක වෙනසක් නිරීක්ෂණය විය. | ස්වේච්ඡාවෙන් විශ්‍රාම ගැනීමේ ක්‍රමවේදයෙන් පසු වගකිවයුතු හෝ දක්ෂ කාර්ය මණ්ඩලයක් නොමැති බැවින්, NEMO හා සම්බන්ධ ගෙවිය යුතු EPF සහ ETF විකල්ප ක්‍රියාමාර්ග ක්‍රියාවලියක් හරහා නැවත සලකා බලනු ලැබේ. | අදාළ උපලේඛන සමඟ සැසඳීමෙන් පසු ගිණුම් නිවැරදිව සකස් කිරීමට පියවර ගත යුතුය. |
| (ඊ) | අදාළ සේවාදායකයා හඳුනා නොගෙන, තැන්පතු, පෙරගෙවුම් සහ අත්තිකාරම් යටතේ රු.මිලියන 33.58 ක බැර ශේෂයක් 'සේවාදායකයින්ගෙන් එකතු කිරීම්' ලෙස ඉදිරිපත් කර තිබුණි. තවද, වෙනත් ලැබිය යුතු ශේෂයන් යටතේ වටිනාකම් නිවැරදි කිරීම් සහ ලබාදුන් ණය ලෙස රු.මිලියන 14.60 ක හර ශේෂයක් ද, බැංකු මාරු කිරීම් ලෙස රු.මිලියන 8.72 ක බැර ශේෂයක් ද ඇතුළත් කර තිබුණි. | උපදේශක සහතිකය සඳහා සේවාදායකයා විසින් සිදු කරන ලද ඍජු ගෙවීම් 'සේවාදායකයින්ගෙන් එකතු කිරීම්' ලෙස වෙනම ගිණුමකට සටහන් කර ඉන්වොයිසි සටහන් කිරීමේදී පසුව ගලපන බවට මෙය පැහැදිලි කළ හැකිය. | අදාළ උපලේඛන සමඟ සැසඳීමෙන් පසු මූල්‍ය ප්‍රකාශන නිවැරදිව සකස් කිරීමට පියවර ගත යුතුය. |

### 1.5.3 සංස්ථාවේ අඛණ්ඩ පැවැත්ම

| විගණන නිරීක්ෂණ | කළමණාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා සංස්ථාවේ ශුද්ධ අලාභය රු. මිලියන 1,509.30 ක් වූ අතර, 2022 දෙසැම්බර් 31 දිනට සංස්ථාවේ රඳවාගත් ඉපයීම්වල හර ශේෂය රු.මිලියන 9,123.41 ක් විය. මීට අමතරව, රු. මිලියන 132.30 ක බැංකු අයිරා සහ රු. මිලියන 3,207.05 ක පොලී සහිත ණය ගැනීම් ද ඇතුළුව, එම දිනය වන විට සංස්ථාවේ ජංගම වගකීම් මඟින් ජංගම වත්කම් ඉක්මවා යාම රු.මිලියන 5,463.13 ක් විය. සංස්ථාව | 2022 වර්ෂය තුළ පැවති ජාතික ආර්ථික අර්බුදකාරී තත්ත්වයන් හේතුවෙන් සිදු වූ අලාභය තවදුරටත් ඇඩි විය. අමාත්‍ය මණ්ඩලය වෙත ප්‍රතිව්‍යුහගතකරණ යෝජනාවක් ඉදිරිපත් කර අනුමැතිය ලබා ගන්නා ලදී. පසුව එය, 2023 වර්ෂයේ 4 වන කාර්තුවේදී සේවකයින් සඳහා ස්වේච්ඡාවෙන් විශ්‍රාම ගැනීමේ ක්‍රමවේදයක් (VRS) හඳුන්වා දීමට අදාළව ලබාගත් තවත් අනුමැතියක් මඟින් | ස්වයං-මූල්‍යකරණ ආයතනයක් ලෙස උපායමාර්ගිකව ලාභය ඉහළ නැංවීම සඳහා, ඉදිකිරීම් ව්‍යාපෘතිවල පිරිවැය මෙන්ම මූල්‍ය පිරිවැය අවම කිරීමට කළමනාකාරිත්වය විසින් පියවර ගත යුතුය. |

| | |
|---|---|
| මුහුණ දුන් මූල්‍ය දුෂ්කරතා හේතුවෙන්, වැටුප් ගෙවීම් පහසු කිරීම සඳහා සමාලෝචිත වර්ෂය තුළ මහා භාණ්ඩාගාරය විසින් රු.මිලියන 465.90 ක මුදලක් ලබා දී තිබුණි. | යාවත්කාලීන කර ප්‍රතිස්ථාපනය කරන ලදී. මීට අමතරව, මූල්‍ය පිරිවැය අවම කිරීම මඟින් වත්මන් මුදල් ප්‍රවාහය සුමටව පවත්වාගෙන යාමට සමගාමීව, ඵලදායී නොවන ස්ථාවර පිරිවැය ඉවත් කිරීමට සහ ඉඩම් පැවරීමේ කටයුතු කඩිනම් කිරීමට තවදුරටත් පියවර ගනිමින් පවතී. එමෙන්ම, මේ වන විට අපගේ රැකියා කළඹ රු. බිලියන 5.5 කට වඩා වැඩි ප්‍රමාණයකින් ඉහළ නැංවීමට ද කටයුතු කර ඇත |

### 1.5.4 විගණනය සඳහා ලිඛිත සාක්ෂි නොමැතිවීම

| | විෂය | මුදල (රු.මි. ) | සාක්ෂි නොමැතිවීම | කළමණාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|---|
| (අ) | තැන්පතු, පෙර ගෙවීම් සහ අත්තිකාරම් | 786.06 | සවිස්තරාත්මක උපලේඛන, කාල විශ්ලේෂණය | අදාළ ගිණුම්කරණ පිළියම් සඳහා සටහන් කර ඇත. | විගණනය සඳහා අවශ්‍ය සියලු විස්තර ඇතුළත් සවිස්තරාත්මක උපලේඛනයක් ඉදිරිපත් කළ යුතුය. |
| (ආ) | ජංගම වගකීම් | 1693.20 | සවිස්තරාත්මක උපලේඛන, කාල විශ්ලේෂණය | අදාළ ගිණුම්කරණ පිළියම් සඳහා සටහන් කර ඇත. | එම |
| (ඇ) | බැංකු ශේෂයන් | 5.06 | බැංකු තහවුරු කිරීමේ ලේඛන බැංකු ප්‍රකාශන සහ බැංකු සැසඳුම් ප්‍රකාශන | අදාළ ගිණුම්කරණ පිළියම් සඳහා සටහන් කර ඇත. | බැංකු තහවුරු කිරීමේ ලේඛන, බැංකු ප්‍රකාශන සහ බැංකු සැසඳුම් ප්‍රකාශන නිසි පරිදි විගණනය සඳහා ඉදිරිපත් කළ යුතුය. |
| (ඈ) | අදායම | 412.99 | සවිස්තරාත්මක උපලේඛන | අදාළ ගිණුම්කරණ පිළියම් සඳහා සටහන් කර ඇත. | විගණනය සඳහා අවශ්‍ය සියලු විස්තර ඇතුළත් සවිස්තරාත්මක උපලේඛනයක් ඉදිරිපත් කළ යුතුය. |
| (ඉ) | වෙළඳ ලැබිය යුතු ශේෂයන් (NEMO) | 231.09 | සවිස්තරාත්මක උපලේඛන | අදාළ ගිණුම්කරණ පිළියම් සඳහා සටහන් කර ඇත. | එම |

| | | | | | |
|---|---|---|---|---|---|
| (ඊ) | තැන්පතු, පෙර ගෙවීම් සහ අත්තිකාරම් | 1,068.45 | සවිස්තරාත්මක උපලේඛන | අදාළ ගිණුම්කරණ පිළියම් සඳහා සටහන් කර ඇත. | එම |
| (එ) | ජංගම වගකීම් | 1,458.04 | සවිස්තරාත්මක උපලේඛන, කාල විශ්ලේෂණය | අදාළ ගිණුම්කරණ පිළියම් සඳහා සටහන් කර ඇත. | එම |
| (ඒ) | දේපල පිරියත හා උපකරණ | 372.88 | ස්ථාවර වත්කම් ලේඛනය | අදාළ ගිණුම්කරණ පිළියම් සඳහා සටහන් කර ඇත. | වත්කම් වාර්තාවල නිවැරදිභාවය සහ සම්පූර්ණත්වය තහවුරු කිරීම සඳහා ස්ථාවර වත්කම් ලේඛනය නිතිපතා යාවත්කාලීන කර පවත්වාගෙන යා යුතුය. |
| (ඔ) | ජංගම වත්කම් සහ ජංගම බැරකම්වල ආරම්භක ශේෂය | 411.90 | සවිස්තරාත්මක උපලේඛන | අදාළ ගිණුම්කරණ පිළියම් සඳහා සටහන් කර ඇත. | විගණනය සඳහා අවශ්‍ය සියලු විස්තර ඇතුළත් සවිස්තරාත්මක උපලේඛනයක් ඉදිරිපත් කළ යුතුය. |

**1.6 ලැබිය යුතු සහ ගෙවිය යුතු ගිණුම්**

**1.6.1 ලැබිය යුතු මුදල්**

| | විගණන නිරීක්ෂණ | කළමණාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය ප්‍රකාශනවල පවතින රු.මිලියන 2,441.56 ක සමස්ත ණයගැති ශේෂයෙන් සියයට 64 ක් නියෝජනය කරන, කණ්ඩායම් හතකට අදාළ රු.මිලියන 1,565.57 ක වෙළඳ ණයගැති ශේෂයන් වසර 03 කට වැඩි කාලයක් තිස්සේ අයකර නොගෙන පැවතුණි. | පසුකාලීන මූල්‍ය වර්ෂය තුළ රු.මිලියන 675 ක මුදලක් අයකර ගැනීම හේතුවෙන් වෙළඳ ණයගැති ශේෂයන් තවදුරටත් අඩු වූ අතර, එහි ප්‍රතිඵලයක් ලෙස 2025 දෙසැම්බර් 31 දින වන විට එම ශේෂය රු.මිලියන 1,766.66 දක්වා අඩු වී තිබුණි. | ලැබිය යුතු ශේෂයන් කඩිනමින් අයකර ගැනීම සඳහා නිසි පියවර අනුගමනය කළ යුතුය. |
| (ආ) | තැන්පතු, පෙරගෙවුම් සහ අත්තිකාරම් ලෙස විවිධ වර්ගීකරණයන් යටතේ රු.මිලියන 1,013.45 ක අත්තිකාරම් මුදලක් වාර්තා කර තිබුණි. ඉන් රු.මිලියන 589.05 ක සමස්ත ශේෂයක් වසර තුනකට වැඩි කාලයක් පුරා හිඟව පැවතුණි. | 2025 වර්ෂය සඳහා දැනට පවතින අත්තිකාරම් මූලාශ්‍ර ලේඛනවලට අනුකූලව ගිණුම් සමාලෝචනය කර සංසන්දනය කර ඇත. පියවන ලද ශේෂයන් ද ඇතුළත්ව, 2026 වර්ෂය සඳහා ගිණුම්කරණ පද්ධතිය යාවත්කාලීන කිරීමේදී, කාල විශ්ලේෂණ සීමාව වසර 3 | මෙම ශේෂයන් කඩිනමින් පියවීමට සහ නිරවුල් කිරීමට පියවර ගත යුතුය. |

| | | | |
|---|---|---|---|
| | | සිට වසර 5 දක්වා සංශෝධනය කරන ලෙස ඉල්ලා ඇත. | |
| (ඇ) | 2009 වර්ෂයේ සිට නාගරික සංවර්ධන අධිකාරියේ (U.D.A) අංක 1575 දරන වැඩබිම යටතේ වෙනත් ලැබිය යුතු ශේෂයන්ට ඇතුළත් කර තිබූ රු.මිලියන 5.40 ක ශේෂය, 2025 දෙසැම්බර් 31 දින දක්වාම අයකර ගෙන නොතිබුණි. | මාලිගාවත්ත පිරවුම්හල් පරිශ්‍රයේ සිට නුගේ පාර දක්වා පරිශ්‍රය මාරු කිරීම සඳහා ඉක්මවා ගිය වියදම නාගරික සංවර්ධන අධිකාරියෙන් අයකර ගැනීමට අපේක්ෂා කරන අතර තහවුරු කිරීමේ ක්‍රියාවලිය අවසන් වූ පසු එය ගිණුම්වල ගැලපීම් කරනු ඇත. | ලැබිය යුතු ශේෂයන් අයකර ගැනීමට පියවර ගත යුතුය. |
| (ඈ) | 2022 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු රඳවා ගැනීමේ ශේෂය රු.මිලියන 1,309.24 ක් වුවද, එම ශේෂයට අදාළ සවිස්තරාත්මක උපලේඛන ව්‍යාපෘති පදනම මත විගණනය සඳහා ඉදිරිපත් කර නොතිබුණි. ඒ අනුව, මෙම ශේෂයන් නිම කරන ලද ව්‍යාපෘතිවලට හෝ දැනට ක්‍රියාත්මක වන ව්‍යාපෘතිවලට අදාළ ද යන්න සත්‍යාපනය කිරීමට නොහැකි විය. තවද, රු. මිලියන 682.71 ක ලැබිය යුතු රඳවා ගැනීම් ශේෂයන් වසර පහකට වැඩි කාලයක් පුරා හිඟව පවතින බව නිරීක්ෂණය විය. | රඳවා තබා ගැනීමේ මුදල් අයකර ගැනීම තීරණය කරනු ලබන්නේ සහ අවසන් කරනු ලබන්නේ අවසාන අදියර සඳහා සහතික නිකුත් කිරීමේ ක්‍රියාවලියේදීය. | කාලීනව ලැබිය යුතු රඳවා ගැනීමේ ශේෂයන් අයකර ගැනීමට පියවර ගත යුතුය. |
| (ඉ) | 2022 දෙසැම්බර් 31 දිනට ක්‍රියාත්මක නොවන ව්‍යාපෘති සඳහා ගනුදෙනුකරුවන්ගෙන් ලැබිය යුතු ශේෂය සහ ගනුදෙනුකරුවන්ට ගෙවිය යුතු ශේෂය පිළිවෙලින් රු.මිලියන 1,208.08 ක් සහ රු. මිලියන 507.31 ක් විය. අදාළ ව්‍යාපෘති නිම කරන තෙක් හෝ අත්හිටවන තෙක් මෙම ශේෂයන් පවතී. | පිළිගන්නා අතර අවසන් කිරීමේ කටයුතු සිදු කරමින් පවතී. | අක්‍රීය ව්‍යාපෘති අවසන් කිරීමට සහ අවසාන බිල්පත් කඩිනමින් සහතික කරවා ගැනීමට පියවර ගත යුතුය. |

**1.6.2 ගෙවිය යුතු මුදල්**

| | විගණන නිරීක්ෂණ | කළමණාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | වසර 3 කට වඩා පැරණි රු.මිලියන 1,859.23 ක ජංගම වගකීම් සහ රු.මිලියන 10.56 ක ආදායම් බදු මුදලක් 2013 වර්ෂයේ සිටම පියවීමකින් තොරව | වත්මන් මුදල් ප්‍රවාහය මෙන්ම දැනට ක්‍රියාත්මක වන ව්‍යාපෘති සහ කාර්යයන්හි අඛණ්ඩතාවය සැලකිල්ලට ගනිමින්, වත්මන් | තවදුරටත් ප්‍රමාද කිරීමකින් තොරව, හිඟ ශේෂයන් පියවීමට පියවර ගත යුතුය. |

| | | | |
|---|---|---|---|
| | පැවතුණි. තවද, 2022 දෙසැම්බර් 31 දිනට පවතින රු.මිලියන 57.69 ක උපචිත වියදම් සහ වෙනත් ප්‍රතිපාදන අතුරින්, සමාලෝචිත වර්ෂය තුළ උපචිත වී තිබුණේ රු.මිලියන 5.03 ක් පමණි. ඉතිරි රු.මිලියන 52.66 ක මුදල සමාලෝචිත වර්ෂයට පෙර උපචිත වූ ශේෂයන් වන අතර, ඒවා 2022 දෙසැම්බර් 31 දිනටත් ගෙවා නොතිබුණි. | මෙහෙයුම් කටයුතු කෙරෙහි බලපෑමක් ඇති කරන ජංගම වගකීම් ප්‍රමුඛතා පදනමක් මත පියවීමට ආයතනික කළමනාකාරිත්වය විසින් ප්‍රතිපත්තිමය තීරණයක් ගෙන ඇත. සෙසු වගකීම් පියවීම, ඉඩම් පැවරීමෙන් ලැබෙන ආදායම් වැනි විශේෂ ක්‍රියාවලීන්ගෙන් මූලාශ්‍ර සොයා ගන්නා තෙක් කල් දමනු ලැබේ. | |
| (ආ) | සේවාදායකයින්ගෙන් ලැබුණු රු. මිලියන 899.82 ක වැඩ ආරම්භ කිරීමේ අත්තිකාරම් මුදල් එකතුවක්, 2022 දෙසැම්බර් 31 දිනටත් පියවීමකින් තොරව වසර 05 කට වැඩි කාලයක් පුරා පැවතුණි. තවද, ඉන් රු මිලියන 29.40 ක මුදලක් සියයට 90 කට වඩා වැඩියෙන් නිම කරන ලද ව්‍යාපෘතිවලට අදාළ වේ. | දීර්ඝ කාලයක් තිස්සේ පවතින වැඩ ආරම්භ කිරීමේ අත්තිකාරම් පියවීමට නොහැකි වීම කෙරෙහි පහත සඳහන් හේතූන් බලපා ඇති අතර, ඒවා රාජ්‍ය ඉංජිනේරු සංස්ථාවේ පාලනයෙන් බැහැර වූ කරුණු වේ.<br>ව්‍යාපෘතියක් ආරම්භ කර හෝ අර්ධ වශයෙන් නිම කිරීමෙන් පසුව, සේවාදායකයා විසින් නිසි අවලංගු කිරීමේ ක්‍රියාපටිපාටියක් අනුගමනය නොකර ව්‍යාපෘති අත්හිටුවීම, ප්‍රතිපාදන හිඟකම හේතුවෙන් හෝ කාර්යයේ විෂය පථය හෝ අරමුණ වෙනස් වීම යනාදිය හේතුවෙන් ව්‍යාපෘති සඳහා වසර කිහිපයක් ගත වීම. | තවදුරටත් ප්‍රමාද කිරීමකින් තොරව, සම්මත ලංසු තැබීමේ ලේඛන හෝ ප්‍රසම්පාදන මාර්ගෝපදේශවලට අනුකූලව වැඩ ආරම්භ කිරීමේ අත්තිකාරම් පියවීමට පියවර ගත යුතුය. |

**1.7 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම**

| | නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව. | අනුකූල නොවීම | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| (අ) | සාමාන්‍යාධිකාරිවරයා විසින් නිකුත් කරන ලද 2020 දෙසැම්බර් 18 දිනැති හා අංක 2020/48 දරන ඇණවුම් සමඟ චෙක්පත් | 2024 දෙසැම්බර් 31 දින වන විට චෙක්පත් මගින් නිකුත් කරන ලද රු. මිලියන 979.05 ක් වූ අත්තිකාරම් මුදල් පියවා නොතිබූ අතර ඉන් | දිගු කලක් තිස්සේ පියවීමට ඉතිරිව ඇති මෙම සියලුම ගෙවීම් නියමිත කාලසීමාව තුළ පියවීමට විශේෂ අවධානයක් යොමු කෙරේ. | චක්‍රලේඛ උපදෙස්වලට අනුකූලව මෙම අත්තිකාරම් පියවා ගැනීම සඳහා අවශ්‍ය පියවර ක්‍රියාත්මක කළ යුතුය. |

| | | | | |
|---|---|---|---|---|
| | පිළිබඳ අභ්‍යන්තර චක්‍රලේඛයේ 8 වන ඡේදය. | රු.මිලියන 134.18ක මුදලක් වසර 3 සිට 5 දක්වා කාලයක් ද, රු.මිලියන 182.52ක මුදලක් වසර 5කට වැඩි කාලයක් ද වශයෙන් නොපියවා හිඟව පැවතිණි. | | |
| (ආ) | 1979 දෙසැම්බර් 20 දිනැති අංක 122/1979 දරන විශේෂ මුදල් අත්තිකාරම් පිළිබඳ අභ්‍යන්තර චක්‍රලේඛයෙහි 4 වන ඡේදය. | භාණ්ඩ හෝ සේවා සැපයීම වෙනුවෙන් විශේෂ මුදල් අත්තිකාරම් නිකුත් කරන විට එම අත්තිකාරම් දින 14ක් ඇතුළත පියවිය යුතුය. එසේවුවද, 2024 දෙසැම්බර් 31 වන විට රු.මිලියන 10.62ක වටිනාකමකින් යුත් වසරකට වැඩි කාලයක් තිස්සේ පියවා නොතිබූ විශේෂ මුදල් අත්තිකාරම් ඉතිරිව පැවතුණි. | 2024 වර්ෂයේදී එසේ දිගු කලක් තිස්සේ අය විය යුතුව තිබූ මුදලක් දක්නට ලැබුණද විගණන වාර්තාව නිකුත් කරන දිනය වන විට එම මුදල රු.මිලියන 5.51 දක්වා අඩු වී ඇති අතර, ඒවා අය කර ගැනීමේ ක්‍රියාමාර්ග තවදුරටත් ක්‍රියාත්මක වෙමින් පවතී. | - එම - |

**1.8 බදු රෙගුලාසි වලට අනුකූල නොවීම**

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2024 දෙසැම්බර් 31 වන විටත් රු.මිලියන 1,423.33 ක එකතු කළ අගය මත බදු (VAT) දේශීය ආදායම් දෙපාර්තමේන්තුව වෙත ප්‍රේෂණය කිරීමට පියවර ගෙන නොතිබුණි. | 2025 ජුනි 17 දිනැති අංක අමප/25/0921/814/043 දරන අමාත්‍ය මණ්ඩල තීරණය මගින් අනුමත කරන ලද සහ අමාත්‍ය මණ්ඩලය විසින් පත් කරන ලද (සාමාජිකයෙකු ලෙස දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ කොමසාරිස් ජනරාල්වරයා ද | සංස්ථාව විසින් 2002 අංක 14 දරන එකතු කළ අගය මත බදු පනතට අනුකූලව එකතු කළ අගය මත බදු ගෙවිය යුතුය. |

| | | | |
|---|---|---|---|
| | | නියෝජනය කරන) අනුකම්ටුවක් විසින් ද තවදුරටත් පිළිගන්නා ලද යෝජිත ඉඩම් පැවරීමේ ක්‍රියාවලියෙන් ලැබෙන ආදායම මගින් ගෙවීමට ඉතිරිව ඇති සියලුම හිඟ වැට් (VAT) බදු මුදල් පියවීමට සැලසුම් කර ඇත. | |
| (ආ) | 2019 වර්ෂය සහ ඊට පෙර වර්ෂවලට අදාළව දේශීය ආදායම් දෙපාර්තමේන්තුව වෙත ගෙවිය යුතු රු.මිලියන 65.21ක ජාතිය ගොඩනැගීමේ බදු මුදල පියවීම සඳහා කිසිදු පියවරක් ගෙන නොතිබුණි. | ඉහතින් සඳහන් කළ ප්‍රතිව්‍යුහගත කිරීමේ ක්‍රියාවලියට අනුව බදු බලධාරීන් සමඟ සාකච්ඡා කර පියවීමට කටයුතු සිදු කෙරේ. | සංස්ථාව බදු නීති වලට අනුගත විය යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලය රු. මිලියන 1,509.88 ක පාඩුවක් වූ අතර ඊට අනුරූප ඉකුත් වර්ෂයේ එම පාඩුව රු.මිලියන 1,739.55 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු. මිලියන 229.67 ක වර්ධනයක් නිරීක්ෂණය විය. මෙම වර්ධනයට විකුණුම් පිරිවැය අඩුවීම හා පරිපාලන වියදම් අඩුවීම ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

### 2.2 ප්‍රධාන ආදායම් හා වියදම් විෂයයන්වල ප්‍රවණතා විශ්ලේෂණය

පසුගිය වර්ෂය හා සසඳන විට සමාලෝචිත වර්ෂය තුළ ආදායම රු. මිලියන 551.63 කින් අඩු වී ඇති අතර එය සියයට 17.62 ක පහත වැටීමක් නියෝජනය කරයි. විකිණුම් පිරිවැය සහ පරිපාලන වියදම් පිළිවෙලින් රු.මිලියන 571.10 කින් සහ රු.මිලියන 55.91 කින් අඩු වී ඇත. තවද, ශුද්ධ මූල්‍ය වියදම රු. මිලියන 363.79 කින් ඉහළ ගිය අතර එය පසුගිය වසරට සාපේක්ෂව සියයට 130.59 ක වැඩිවීමකි.

### 2.3 අනුපාත විශ්ලේෂණය

2022 සහ 2021 යන වර්ෂවලදී සංස්ථාව පිළිවෙලින් සියයට 59ක සහ සියයට 56ක සෘණ ශුද්ධ ලාභ අනුපාතයක් වාර්තා කළ අතර එහි කෙටි කාලීන ද්‍රවශීලතා තත්ත්වය දිගින් දිගටම දුර්වල මට්ටමක පැවති බව පෙන්නුම් කරමින් පෙර වර්ෂයේ මෙන්ම සමාලෝචිත වර්ෂයේදී ද සංස්ථාවේ ජංගම අනුපාතය 0.6:1 මට්ටමේ පැවතුණි.

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 මෙහෙයුම් අකාර්යක්ෂමතා

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | මෙම සංස්ථාවේ අරමුණු වන්නේ ගොඩනැගිලි, සිවිල් ඉංජිනේරු සහ වෙනත් ඉංජිනේරු ව්‍යාපෘති විමර්ශනය, සැලසුම්කරණය, නිර්මාණකරණය සහ | සාමාන්‍ය මිල මට්ටම ඉහළ යාම සහ ආනයන සීමා කිරීම් වැනි ජාතික ආර්ථික බලපෑම් හේතුවෙන් 2022 වසරේ සිට පාඩු ඉහළ යාමක් දක්නට | මනා සැලසුම්කරණය සහ නිසි අධීක්ෂණය මගින් මූල්‍යමය පාඩු අවම කර ගැනීමටත්, ලාභය ඉහළ |

| | | | |
|---|---|---|---|
| | ඉදිකිරීම් සිදු කිරීම, උපදේශන සහ ව්‍යාපෘති කළමනාකරණ සේවා සැපයීම මෙන්ම නිමි මිශ්‍ර කොන්ක්‍රීට්, සවිගැන්වූ කොන්ක්‍රීට් සහ පෙරදි කොන්ක්‍රීට් ආශ්‍රිත නිෂ්පාදන නිෂ්පාදනය හා අලෙවිය සිදු කිරීම යනාදියයි. 2022 දෙසැම්බර් 31 වන විට ක්‍රියාත්මක වෙමින් පැවති ඉදිකිරීම් ව්‍යාපෘති 93 අතුරින් ව්‍යාපෘති 14 ක් වෙනුවෙන් රු.මිලියන 251.84 ක අලාභයක් ලබා ඇති අතර 2022 දෙසැම්බර් 31 වන විට එම ව්‍යාපෘතිවලින් ලද සමුච්චිත අලාභය රු. මිලියන 785.62 කි.<br>තවද, ජාතික යන්ත්‍රෝපකරණ ආයතනය මඟින් ක්‍රියාත්මක කරන ලද තිස්ස කොට්ඨාශයේ රන්මිණිතැන්න ප්‍රධාන ඇළ මාර්ගය දිගු කිරීමේ ව්‍යාපෘතිය වෙනුවෙන් සමාලෝචිත වර්ෂය තුළ රු. මිලියන 3.29 ක පාඩුවක් සහ 2022 දෙසැම්බර් 31 වන විට රු. මිලියන 36.95 ක සමුච්චිත පාඩුවක් සිදුවී ඇත. | ලැබුණි. ව්‍යාපෘති පිරිවැය ආර්ථිකමය වශයෙන් කළමනාකරණය කරමින් 2026 වසරේ මැද භාගයට පෙර ඉතිරිව ඇති සියලුම ව්‍යාපෘති කටයුතු කෙටි කාලයක් තුළ අවසන් කිරීමට කළමනාකාරිත්වය අපේක්ෂා කරයි. ව්‍යාපෘති ක්‍රියාකාරකම් අවසන්කිරීම සිදු කරන අවස්ථාවේදී ව්‍යාපෘති ප්‍රතිඵල පිළිබඳව තවදුරටත් පරීක්ෂාකර බලනු ඇත. | නංවාගැනීමටත් සංස්ථාවේ කළමනාකාරිත්වය අවධානය යොමු කළ යුතුය. |
| (ආ) | ස්ථිර වැඩබිම් සහ වැඩපළවල්වල කාර්ය සාධනය සම්බන්ධයෙන් සංස්ථාව විසින් ඉදිරිපත් කරන ලද 2022 වර්ෂයට අදාළ ආදායම් සහ වියදම් විස්තර විශ්ලේෂණය කිරීමේදී, සමාලෝචිත වර්ෂය තුළ වැඩබිම් දොළහක රු.මිලියන 172.89 ක සමස්ත අලාභයක් සිදුවී ඇති බවත් වැඩබිම් පහක් පමණක් ලාභ උපයා ඇති බවත් නිරීක්ෂණය විය. | 2024 අප්‍රේල් 01 දිනැති 2022/AQ/01/04 දරන විගණන විමසුම ඉදිරිපත් කිරීමේදී ස්ථිර වැඩබිම් සම්බන්ධයෙන් සිදුවූ අලාභයට හේතු එක් එක් වැඩබිමට වෙන් වෙන් වශයෙන් ගෙන සාකච්ඡා කරන ලදී. ප්‍රතිව්‍යුහගත කිරීමේ ක්‍රියාවලිය ආරම්භ වන තෙක් පවතින අන්තර්කාලීන කාලසීමාව තුළ 'ප්‍රී-කාස්ට්' (precast) පද්ධතිය නැවත ස්ථාපනය කිරීමටත්, ස්ථිර වැඩබිම් සඳහා වන සැලසුම් වැඩිදියුණු කිරීමට හෝ අලුතින් හඳුන්වා දීමටත් අවශ්‍ය ඉදිරි පියවර උපායමාර්ගික ව්‍යාපාර සැලැස්ම හරහා හඳුන්වා දී ඇත. | වඩාත් හොඳ කාර්ය සාධනයක් තුළින් මූල්‍යමය පාඩු අවම කර ගැනීමටත්, ලාභය ඉහළ නංවාගැනීමටත් සංස්ථාවේ කළමනාකාරිත්වය අවධානය යොමු කළ යුතුය. |
| (ඇ) | සංස්ථාව විසින් 2022 වර්ෂයට පෙර ක්‍රියාත්මක කරන ලද ව්‍යාපෘති 138 ක් සඳහා රු.මිලියන 6,973.28ක මුදලක් වැය කර තිබුණද ඉන්වොයිසි නිකුත් කර තිබුණේ රු.මිලියන 5,694.28ක වටිනාකමක් සඳහා පමණි. එමෙන්ම NEMO අංශය විසින් | ප්‍රායෝගිකව සම්පූර්ණකිරීම හෝ අවසාන සහතිකය නිකුත් කිරීමේදී හෝ ව්‍යාපෘති අවසන් කිරීමේ ක්‍රියාවලිය සිදු කෙරෙමින් පවතින අවස්ථාවේදී අය නොවූ මුදල් ප්‍රමාණය වෙනස්වනු ලැබේ. | හිඟ මුදල් කඩිනමින් අය කර මෙම තත්ත්වය විසඳා ගැනීමට අවශ්‍ය පියවර ගත යුතුය. |

| | | | |
|---|---|---|---|
| | 2022 වර්ෂයට පෙර ක්‍රියාත්මක කරන ලද ව්‍යාපෘති 12 ක් සඳහා රු.මිලියන 94.14 ක මුදලක් වැය කර තිබුණද ඉන්වොයිසි නිකුත් කර තිබුණේ රු.මිලියන 65.22 ක වටිනාකමක් සඳහා පමණි. මෙම ව්‍යාපෘති තවදුරටත් ක්‍රියාත්මක නොවන තත්ත්වයක පවතින බැවින් ඉතිරි මුදල වන රු.මිලියන 1,307.92ක මුදල නැවත අය කර ගැනීමට සංස්ථාවට නොහැකි වීමේ අවදානමක් පවතී. | සමාලෝචිත වර්ෂය තුළ ව්‍යාපෘති ආදායම අතරමැදි සහතික කිරීම් / බිල්පත් හරහා හඳුනා ගන්නා ලදී. ව්‍යාපෘතිය ප්‍රායෝගිකව නිම කිරීමේ අවසාන සහතිකය නිකුත් කළ විගස තවත් ආදායමක් එකතු විය හැකි අතර එය ලාභයක් හෝ අලාභයක් ලෙස සිදුවිය හැක. | |
| (ඈ) | සමාලෝචිත වර්ෂය සඳහා වූ ලාභ ගණනය කිරීමේ ප්‍රකාශයට ඇතුළත් නොකළ සහ කිසිදු වියදමක් දරනු නොලැබූ (උදා- ක්‍රියාත්මක නොකළ) ව්‍යාපෘති සම්බන්ධයෙන් රු.මිලියන 21.43 ක අමුද්‍රව්‍ය තොග ශේෂයන් තවදුරටත් වාර්තා වී තිබුණි. එසේවුවත් මෙම අමුද්‍රව්‍ය වෙනත් ව්‍යාපෘති වෙත වෙන්කරදීමක් හෝ මාරු කිරීමක් සිදු කර නොතිබුණි. | අදහස් දක්වා නැත. | අවශ්‍යතාවය අනුව පමණක් අමුද්‍රව්‍ය මිලදී ගැනීමට පියවර ගත යුතු අතර භාවිතයට නොගත් අතිරික්ත තොගයක් පවතී නම් එය වෙනත් ව්‍යාපෘතියක් සඳහා වෙන් කරදිය යුතුය. |
| (ඉ) | 2022 දෙසැම්බර් 31 වන දිනට ඒකක මිල ගණන් නොතිබීම හේතුවෙන් තොග අයිතම 256 ක් වටිනාකම තීරණය කර මූල්‍ය ප්‍රකාශනයට ඇතුළත් කර නොතිබුණි. | සියලුම භාණ්ඩවල මිල නියම කිරීම සඳහා කඩිනමින් ගත හැකි ක්‍රියාමාර්ග පිළිබඳව ව්‍යාපෘති කණ්ඩායම අංශ ප්‍රධානීන් සමඟ තීරණාත්මක සාකච්ඡා පවත්වා ඇති අතර එහි ප්‍රතිඵල විගණකවරුන් වෙත දැනුම් දෙනු ඇත. | තොගයේ වටිනාකම තීරණය කිරීමටත් ඊළග මූල්‍ය ප්‍රකාශනවල ඉදිරිපත් කිරීමටත් පියවර ගත යුතුය. |
| (ඊ) | යාපනය (වෙල්ලවෙලි) හි යෝජිත ඇවිදින මංතීරු සහ උද්‍යාන අලංකරණ ව්‍යාපෘතිය සඳහා 2022 ජනවාරි 01 වන දින වන විට දරන ලද සමස්ත වියදම රු.මිලියන 3.55 ක් විය. එසේවුවත් 2022 දෙසැම්බර් 31 වන දින වන විට ව්‍යාපෘතියේ සමස්ත වියදම රු.මිලියන 0.22 ක් ලෙස දක්වා තිබුණු අතර එය එම මුදල රු. මිලියන 3.33 කින් අඩු කර දැක්වීමකි. කෙසේ වුවද 2022 වර්ෂය සඳහා වූ ලාභ ගණනය කිරීම අනුව රු.මිලියන 6.39ක වටිනාකමකින් යුත් ඉන්වොයිසි නිකුත් කර තිබූ අතර විගණනයේදී මෙම විෂමතාව නිරීක්ෂණය විය. | NEMO ව්‍යාපෘතිවල පිරිවැය වෙන්කර දැක්වීම / බෙදා දැක්වීම ව්‍යාපෘති අවසන් කිරීමේ විශේෂ ක්‍රියාකාරකමක් ලෙස තවදුරටත් අධ්‍යානය කළ යුතුව ඇත. | ව්‍යාපෘති විස්තර නිවැරදිව වාර්තා කිරීමට පියවර ගත යුතුය. |

**4. ගිණුම්කටයුතුභාවය සහ යහපාලනය**

**4.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2021 නොවැම්බර් 16 දිනැති රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛ අංක 01/2021 හි 6.6 වන ඡේදය ප්‍රකාරව මූල්‍ය වර්ෂය අවසන් වී දින 60ක් ඇතුළත මූල්‍ය ප්‍රකාශන සහ කෙටුම්පත් වාර්ෂික වාර්තාව විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතුය. එසේවුවත් 2022 වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන විගණකාධිපති වෙත ඉදිරිපත් කර තිබුණේ 2025 නොවැම්බර් 14 වන දින ය. | අදාළ ව්‍යවස්ථාපිත අවශ්‍යතා මනාව සැලකිල්ලට ගනිමින්, පසුගිය වසරවල මූල්‍ය ප්‍රකාශන කඩිනමින් ඉදිරිපත් කිරීමටත් වත්මන් වාර්තාකරණ කටයුතු යාවත්කාලීන කිරීමටත් කළමනාකාරීත්වය සහ අධ්‍යක්ෂ මණ්ඩලය දැඩි උනන්දුවකින් කටයුතු කරනු ලබයි. | චක්‍රලේඛ උපදෙස්වලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන සහ කෙටුම්පත් වාර්ෂික වාර්තා ඉදිරිපත් කිරීම සඳහා අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතුය. |